*සැ. යු.* - (i) 2022.09.23 වැනි දින පළ වූ 2299 දරන *ගැසට් පත්‍රයේ* I/II (අ) සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,300 - 2022 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2022.09.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 214 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ඔක්තෝබර් මස 21 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ඔක්තෝබර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ආර්. එම්. ශමීර නුවන් රත්නායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.04 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/පස්/730 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන ඉඹුල්පිටිය වත්තහි පදිංචි සමරකොන් මුදියන්සේලාගේ තෙන්නකෝන් වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඒ 05/76 යටතේ 1995.11.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.10.30** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ පස්බාගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඹුල්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හෝල්ගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, මහනුවර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 61/22/2 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මූපී මහ 2299 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 46 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.101 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම, ඉඹුල්පිටියවත්ත.

| | | |
|---|---|---|
| *උතුරට* | : | 44 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | 44, 45, 54 කැබලි, |
| *දකුණට* | : | 43 කැබැල්ල, |
| *බස්නාහිරට* | : | 43 කැබැල්ල. |

ආර්. එම්. ශමීර නුවන් රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
පස්බාගේ කෝරළේ.

2022 පෙබරවාරි මස 28 වැනි දින.

09-351/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් එක්දහස් නවසිය අසූනවයේ අප්‍රේල් මස විසි එක්වන වැනි දින ප්‍රදානය කර ඇති අංක මහ/කොත්/දොර/ප්‍ර/ගො/225 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රම්බොඩ දොරගල හි පදිංචි මාපලගම ආචාරිගේ එරමානිස්හාමි වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ.සී. 5/146 යටතේ 1989.11.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.10.30** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතු යි.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර ඉහළ කෝරළේ 307 පුස්සැල්ලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පුස්සැල්ලාව ඉහළගම නමැති ගමේ පිහිටා ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 61/18/2, 61/191 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි රේඛා අංක මු. පි. මහ 2943 දරන අංක 34 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.177ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : දොරගල,

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක - 36 සහ කැබලි අංක -1 (මාර්ගය), |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 1 (මාර්ගය) සහ කැබලි අංක - 12, |
| *දකුණට* | : | කැබලි අංක 12 සහ කැබලි අංක 35, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 35 සහ කැබලි අංක 36. |

ආර්.ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත - ගම්පොල.

2021 දෙසැම්බර් මස 08 වැනි දින.

09-351/2

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් පිහිලිඇලේ ගෙදර සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.01.10 දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර/1414 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය යාය 01 පදිංචි වරුසමාන පේඩිගේ සුභනේරිස් මහතා වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2604 යටතේ 2000.05.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.10.28** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එප්පාවල කෝරළේ 442 ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ රොටවැව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 10 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. සි. අ. 434 දරන රේඛා සටහනේ අංක 1229 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් රූඩ් 01, පර්. 38 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම. (ගොඩ)

*උතුරට* : අංක 1256 ජනපද මාර්ග රක්ෂිය,
*නැගෙනහිරට* : අංක 1230 ඉඩම,
*දකුණට* : අංක 1234 වාරිමාර්ග ඇළ රක්ෂිතය,
*බස්නාහිරට* : අංක 1228 ඉඩම.

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2022 ජනවාරි මස 10 වැනි දින.

09-372

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ප්‍රතිසංස්කරණ ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) යටතේ දැනුම් දීමයි

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සහකාර ඉඩම් කොමසාරිස් (පළාත් පාලන) ආර්. එම්. ආර්. එස්. තිලකරත්න වන මා ඉඩම් ප්‍රතිසංස්කරණ ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් මස 02 වැනි දින ප්‍රදානය කරන ලද අංක මො/ප්‍ර 9322 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ආර්. බී. එම්. සුදුබණ්ඩා නමින් නිකුත් කරන ලද මොණරාගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/M7/75 යටතේ 1995.11.14 වැනි දින ලියාපදිංචි කර ඇති ඉඩම අනුප්‍රාප්තිකභාවය නීත්‍යානුකූලව හිමිකරු නොමැති අවස්ථාවක *නොහොත්* හිමිකරු සිටින අවස්ථාවේ දී හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයන් හට පැවරීමට අකමැති නම් අනුප්‍රාප්තිකයෙකු පත්කර ගැනීමට නොමැති බව දන්වා සිටි බැවින් එම ප්‍රදාන පත්‍රය අදාළ ප්‍රඥප්තිය 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට කටයුතු කරගෙන යන බව මෙයින් දැනුම් දෙමි. මේ සම්බන්ධව යම් කිසි විරුද්ධතාවයක් ඇත්නම් ඒ බව **2022.10.28** දිනට ප්‍රථම ලිඛිතව මා හට දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුත්තල කෝරළේ ඔක්කම්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඔක්කම්පිටිය නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, මොණරාගල මැනුම් අධිකාරි භාරයේ ඇති මොණරාගල මැනුම් අධිකාරි විසින් සම්පාදිත අංක අ. භූ. පි. $54^{H}$ පිඹුරේ අංක 807 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.719 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම.

*උතුරට* : අංක 818 බිම් කැබැල්ල,
*නැගෙනහිරට* : අංක 818 බිම් කැබැල්ල,
*දකුණට* : අංක 808 , 809 හා මාර්ග රක්ෂිතය,
*බස්නාහිරට* : මාර්ග රක්ෂිතය හා අංක 818 බිම් කැබැල්ල.

ආර්. එම්. ආර්. එස්. තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
බුත්තල.

2022 මැයි මස 19 වැනි දින.

09-373

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/15421.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NWP/PLC/L9/AN/LTL/03.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

පුත්තලම දිස්ත්‍රික්කයේ, ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 656 බී තම්මැන්නාගම ග්‍රාම නිලධාරි වසමේ තොනිගල ගමේ අ. හු. පි. 02 පිඹුරෙහි අතිරේක 21 හි කැබලි අංක 552 (රේඛා චිත්‍ර අංක O/පු 331) සැලැස්ම අනුව ප්‍රමාණයෙන් හෙක්. 0.6960 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ස්මාර්ට් ෂර්විස් (ලංකා) ලිමිටඩ් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

අ. හු. පි. 02 හි අතිරේක අංක 21 හි රේඛා චිත්‍ර අංක 0/පු/331 හි කැබලි අංක 552 හි මායිම්,

*උතුරට* : කැ. අංක 551 සහ ෑ. අංක 533,
*නැගෙනහිරට* : කැ. අංක 533 සහ කැ. අංක 553,
*දකුණට* : කැ. අංක 553,
*බටහිරට* : කැ. අංක 551.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) ( 2022.08.17 සිට ඉදිරියට වසර තිහක්).

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* .- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2022.08.17 වැනි දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*(ඒ)* බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. ආර්. ඒ. ටී. ශකුන්තලා විජේසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 සැප්තැම්බර් මස 16 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-374

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.